# ⑧ ආයෝජනය - පිළිතුරු

I කොටස :-

1. පුද්ගලයෙකු තමා උපයන ආදායමෙන් ඉතිරි කරගත් මුදල් ප්‍රමාණයක් යම් ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් ඵලදායී මාර්ගයක යෙදවීම ආයෝජනය නම් වේ.

2.
   - ඉතිරි කිරීමේ ගිණුමක මුදල් තැන්පත් කිරීම
   - ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම
   - දේපළ මිලදී ගැනීම
   - කොටස් වෙළෙඳපොළේ ආයෝජනය
   - තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීම

3.
   - ආයෝජනයෙහි අරමුණු
   - ආයෝජනයෙහි අවදානම
   - ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ

4. <u>ස්ථාවර තැන්පතු</u>
   - ඉතුරුම් ගිණුමකට සාපේක්ෂව ඉහළ අනුපාතයක් යටතේ පොළී හිමි වීම.
   - කල් පිරුණු පසු හෝ ඊට පෙර හෝ අවශ්‍ය නම් මුදල් ආපසු ලබා ගත හැකි වීම.
   - ස්ථාවර තැන්පතු සහතිකය ඇපයට තබා ණය මුදලක් ලබා ගත හැකි වීම.
   - සුරක්ෂිත ආයෝජන මාර්ගයක් වීම

   <u>දේපළවල ආයෝජන</u>

   - ස්ථාවර වත්කම් හිමිකරුවකු වීම නිසා දේපළ පරිහරණය කිරීමේ හැකියාව ලැබීම.
   - දේපළ කුළියට හෝ බද්දට දීමෙන් හෝ උකස් කිරීමෙන් ආදායම් ඉපැයිය හැකි වීම.
   - මුදල් අවශ්‍යතාවක් ඇති වුවහොත් දේපළ විකුණා මුදල් ලබා ගත හැකි වීම.
   - මිලදී ගත් මුදලට වඩා වැඩි මුදලකට විකිණීමෙන් ප්‍රාග්ධන ලාභ ඉපැයීමේ හැකියාව ලැබීම.
   - ණය මුදලක් ලබා ගැනීමේ දී ඇප සුරකුම් ලෙස ඉදිරිපත් කළ හැකි වීම.

5. සීමිත සමාගමක හිමිකම සමාන පංගුවලට බෙදුවහොත් ඉන් එක් පංගුවක් කොටසක් ලෙස හැඳින්වේ.

6. ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාව

7.
   - මිලදී ගත් කොටස් සඳහා ලාභාංශ ආදායම් ලැබිය හැකි වීම.
   - ගත් මිලට වඩා වැඩි වටිනාකමකට විකිණීමෙන් ප්‍රාග්ධන ලාභ උපයාගත හැකි වීම.
   - ඕනෑම අවස්ථාවක සාමාන්‍ය කොටස් අළෙවිකර මුදල් ලබා ගැනීමට හැකි වීම.
   - ණය ලබා ගැනීමේ දී ඇප සුරකුම් ලෙස ඉදිරිපත් කළ හැකි වීම.
   - ඡන්දය භාවිතා කර අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීමේ හැකියාව.
   - අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වීම මගින් සමාගමට සම්බන්ධ තීරණ ගැනීමට දායක විය හැකි වීම.

8. වැඩි ලාභයක් පවතින අවස්ථාවල

9. සාමාන්‍ය කොටස් හිමියන්ට

10. භාණ්ඩාගාර බිල්පත් යනු රජයේ කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන කෙටිකාලීන සුරැකුම්පත් වර්ගයකි.

11. ශ්‍රී ලංකා මහ බැංකුව විසින්

12. බලපත්‍රලාභී වාණිජ බැංකුවලින්

13.

- ස්ථාවර ප්‍රතිශතයක් යටතේ පොළී ආදායමක් ලබා ගත හැකි වීම.
- ඕනෑම අවස්ථාවක දී මුදල් බවට පත් කළ හැකි වීම.
- ආයෝජනය කළ මුදල ආපසු ලැබීම සම්බන්ධයෙන් පූර්ණ රාජ්‍ය ආරක්ෂාවක් හිමි වීම.

14. (අ) ස්ථාවර තැන්පතුවක යෙදවීම
(ආ)

- ඉතුරුම් ගිණුමකට සාපේක්ෂව ඉහළ අනුපාතයක් යටතේ පොළී හිමි වීම.
- නිශ්චිත පොළියක් ලබා ගත හැකි වීම.
- සුරක්ෂිත ආයෝජන මාර්ගයක් වීම.

15.

1) - ස්ථාවර තැන්පතුවල මුදල්යෙදවීම
- දේපළ මිලදී ගැනීම (ඉඩම් හා රත්තරන්)

2) ස්ථාවර තැන්පතු - ඉහළ පොළී ආදායමක් ලැබීම
- අවදානම අඩු වීම/ සුරක්ෂිත ආයෝජන මාර්ගයක් වීම හෝ 4 ප්‍රශ්නයේ ඕනෑම පිළිතුරක්

දේපළ මිලට ගැනීම (ඉඩම් හා රත්තරං) - දේපළ පරිභෝජනයට අවස්ථාවක් ලැබීම
- වැඩි මුදලකට විකිණීම මඟින් ප්‍රාග්ධන ලාභ ලැබීම හෝ 4 ප්‍රශ්නයේ ඕනෑම පිළිතුරක්

3)

- කොටස්වල ආයෝජනය කිරීම
- භාණ්ඩාගාර බිල්පත්වල මිලට ගැනීම
- තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීම

4) යම් දේපලක ආයෝජනය කළ මුදලට වඩා වැඩි මිලකට පසුව විකිණීමෙන් ලැබෙන ලාභය

16.

1) <u>දේපළ මිලදී ගැනීම</u>
පුද්ගලයෙකු තමා ඉතිරි කර ගත් මුදල් ප්‍රමාණයක් දේපළක් මිලදී ගැනීම සඳහා යෙදවීම.
උදා:

- ඉඩම් මිලට ගැනීම
- නිවාස මිලට ගැනීම
- ස්වර්ණාභරණ මිලට ගැනීම
- වාහන මිලට ගැනීම

2)

- ප්‍රාග්ධන ලාභ ලබා ගැනීමේ හැකියාවක් ලැබීම
- එම වත්කම පරිභෝජනයට අවස්ථාවක් ලැබීම
- වත්කම්වල හිමිකරුවකු වීම
- ඇප සුරැකුම් ලෙස ඉදිරිපත් කළ හැකි වීම
- කුලියට හෝ බද්දට දීමෙන් ආදායමක් ලබා ගැනීමට හැකිවීම

3)

- එම මිලදී ගැනීමට දරණ වියදම්
- යථා තත්ත්වයට පත් කිරීමට දරණ වියදම්
- නඩත්තු කිරීම සඳහා දරණ වියදම්
- සොර සතුරු, ස්වාභාවික උවදුරුවලට මුහුණ දීමට දරන වියදම්/ දේපළ රක්ෂණය කිරීමට දරණ වියදම්
- අලුත්වැඩියා සඳහා දරණ වියදම්

**II කොටස :-**

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 1. | ④ | 11. | ① |
| 2. | ① | 12. | ① |
| 3. | ③ | 13. | ③ |
| 4. | ① | 14. | ① |
| 5. | ③ | 15. | ④ |
| 6. | ④ | 16. | ④ |
| 7. | ③ | 17. | ① |
| 8. | ① | 18. | ④ |
| 9. | ③ | 19. | ① |
| 10. | ④ | 20. | ③ |

**III කොටස :-**

| ප්‍රශ්න අංකය | සත්‍ය/අසත්‍ය | ප්‍රශ්න අංකය | සත්‍ය/අසත්‍ය |
|---|---|---|---|
| 1. | X | 11. | √ |
| 2. | X | 12. | X |
| 3. | X | 13. | √ |
| 4. | X | 14. | √ |
| 5. | √ | 15. | X |
| 6. | √ | 16. | X |
| 7. | √ | 17. | X |
| 8. | X | 18. | X |
| 9. | X | 19. | √ |
| 10. | √ | 20. | √ |

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව